**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය - 2023**

**------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට ඇති රු.5,469,574 ක් වටිනා ලීටර් 7,500 ක ඔයිල් ස්පිල් ඩිස්පර්සන්ට් තොගය 2023 මාර්තු 23 දින වන විට යල් පැන තිබුණු අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 09 හි 38 ඡේදය ප්‍රකාරව එම වටිනාකම කපාහැරීම වෙනුවට තොගයට ඇතුළත් කර තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල තොගය හා ලාභය අධිගණනය වී තිබුණි. | මෙම තොගය භාවිතා කිරීම සම්බන්ධයෙන් විශේෂඥ දැනුම ඇති පුද්ගලයෙකුගේ උපදෙස් ලබාගෙන අපහරණය කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රාග්ධන ව්‍යාපෘති සහ ධාරිතා සංවර්ධනය සඳහා ලැබී සමාලෝචිත වර්ෂය අවසාන දිනට තවදුරටත් ගෙවිය යුතුව තිබූ රු. 13,834,233 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11 හි 50 හි ඡේදය ප්‍රකාරව වගකීමක් ලෙස හඳුනා නොගෙන කෙරීගෙන යන වැඩ ලෙස සමුච්චිත අරමුදල යටතේ දක්වා තිබුණි. | 2024 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශ වල නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11 හි 44 සිට 49 දක්වා වූ ඡේද වලට අනුව හුවමාරු නොවන ගණුදෙනු වලින් වන අයභාරය හඳුනාගැනීම හා මැනීම කළයුතු වුවද සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ ප්‍රාග්ධන ප්‍රදාන රු. 30,871,230 කින් රු.10,158,619 ක් සහ 2021 හා 2022 වර්ෂවල රසායනාගාර ව්‍යාපෘතියක් සඳහා විදේශ පරිත්‍යාගයක් ලෙස | 2024 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශ වල නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලැබී තිබූ රු.14,182,487 ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | පූර්ව වර්ෂ තුල ලැබී තිබුණු ප්‍රාග්ධන ප්‍රදානයන් සම්බන්ධයෙන් උක්ත ප්‍රමිතියේ 116 සිට 123 දක්වා වූ සංක්‍රාන්ති විධිවිධාන අනුව කටයුතු කර නොතිබීමෙන් තවදුරටත් අයභාරය ලෙස හඳුනාගත යුතු රු.158,722,279 ක් විලම්භිත ප්‍රාග්ධන ප්‍රදාන ලෙස සමුච්චිත අරමුදලේ දක්වා තිබුණි. | 2024 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශ වල නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 19 හි 61 ඡේදය ප්‍රකාරව පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුමක් ලෙස සේවක පාරිතෝෂික සඳහා වෙන්කිරීම් ආයු ගණන ශිල්ප ක්‍රම භාවිතයෙන් නිශ්චය කළයුතු වුවත් එසේ නිශ්චය නොකර අධිකාරියේ සේවකයන් 170 දෙනෙක් සඳහා 2023 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික ලෙස රු.37,115,913 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2023.12.31 දිනට සත්‍ය වශයෙන් සේවයේ නිරත වූ, වසරකට වැඩි සේවා කාලයක් සහිත සියළු සේවකයන් සඳහා පාරිතෝෂික මුදල් වෙන්කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | MV X Press Pearl නෞකා අනතුර සම්බන්ධ රාජකාරි ඉටුකල නිලධාරීන්ට අතිරේක දීමනාවක් ගෙවීම සඳහා 2022 දෙසැම්බර් 31 දිනට රු.62,196,986 ක මුදලක් වෙන් කර තිබූ අතර 2023 වර්ෂයේදී රු.17,991,433 ක මුදලක් ගෙවා තවදුරටත් ගෙවීම් කිරීමට රු.7,292,931 තිබුණද වර්ෂය අවසානයේ ගිණුම්වල ගෙවිය යුතු වියදම් ලෙස රු.44,205,553 ක් පෙන්නුම්කර තිබීමෙන් රු.36,912,622 ක අධිවෙන් කිරීමක් නිරීක්ෂණය විය. | නෞකා රක්ෂණ සමාගම සමඟ සාකච්ඡා කොට විශේෂ රාජකාරි සඳහා නිලධාරීන්ගේ රාජකාරි මට්ටම අනුව දිනකට ගෙවනු ලබන මුදල ඇ. ඩො. 117 සිට ඇ. ඩො. 22.5 දක්වා වේ. මෙලෙස රජයට ගෙවන මුදලින් විශේෂ රාජකාරි සිදු කල අධිකාරියේ සේවකයන් සඳහා දිනක් සඳහා 20% ක් ද නිවාඩු දිනක් සඳහා 30% ක් ද වන ලෙස ගෙවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට අධිකාරියේ පාලන අධිකාරිය තීරණය කර මෙම මුදල් වෙන් කරන ලදී. | පවතින සාක්ෂි මත මූල්‍ය ප්‍රකාශනවල නිවාරදි වටිනාකම දැක්වීමට කටයුතු කල යුතුය. |
| (ආ) | මෘදුකාංග ව්‍යාපෘති 2 ක් හා දකුණු පළාත් කාර්යාලයේ CCTV පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා අත්තිකාරම් වශයෙන් ගෙවූ රු.1,005,250 ක මුදල අත්තිකාරම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ස්ථාවර | පාලන අංශය විසින් රු .30,250ක මුදල දකුණු පළාත් කාර්යාලයේ CCTV පද්ධතිය අළුත්වැඩියා කටයුතු සඳහා පෞද්ගලික ආයතනය වෙත ගෙවීමට හඳුනාගෙන ගිණුම්ගත කර 2022 | ගෙවා තිබූ අත්කාරම් මුදල නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වත්කම් ලේඛනයට ඇතුලත් කර ප්‍රාග්ධනිත කර තිබුණි. | වර්ෂයේ කෙරීගෙන යන වැඩ ගිණුම් ශේෂය තුල අන්තර්ගත වී ඇත. | |
| (ඇ) | 2024 වර්ෂයේ විශ්‍රාම යාමට නියමිත සේවකයන් 3 දෙනෙකුට අදාළ එකතුව රු.1,799,923 ක පාරිතෝෂිත වෙන්කිරීම හා 2023 වර්ෂයේ ඉල්ලා අස්වී තිබූ නිලධාරීන් 3 දෙනෙකුට අදාළව 2023 දෙසැම්බර් 31 වන විටත් නොගෙවන ලද රු.608,915 ක පාරිතෝෂිත මුදල වශයෙන් එකතුව වූ රු.2,408,838 ක් දිගුකාලීන වගකීම්වලින් ඉවත් කර ජංගම වගකීමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. ඉදිරියේදී විගණන නිර්දේශ අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලැබේ. | ජංගම නොවන වගකීම් හා ජංගම වගකීම් නිවැරදිව හඳුනාගෙන ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | මිරිස්ස ධීවර ව්‍යාපෘතිය සඳහා අධිකාරිය විසින් උපදේශන සේවා සැපයීමට අදාළව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්‍යාංශයෙන් අයවිය යුතු රු.1,945,847 ක මුදල ගිණුම් ගත කර නොතිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ආදායම හා ලැබිය යුතු මුදල් අඩුවෙන් දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. මෙම මුදල 2024 වර්ෂයේ අවසන් ගිණුම්වලින් ඉදිරිපත් කරනු ලැබේ. | ලැබිය යුතු මුදල් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2018 මාර්තු 30 දින අධිකාරිය වෙත පවරා දී තිබුණු ගාල්ල කාර්යාල සංකීර්ණ ගොඩනැඟිල්ල සඳහා “Design & Build” පදනම මත ඉදිකිරීම් කටයුතු සිදුකළ ඉංජිනේරුමය කාර්යන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්‍යාංශයට ගෙවිය යුතු රඳවුම් මුදල රු.5,660,215 ක් වුවද, එය රු.12,636,098 ක් ලෙස රු.6,975,883 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණ සමග එකග වෙමි. මෙම අධි වෙන් කිරීම 2024 වර්ෂයේ අවසන් ගිණුම් වලින් ගැලපීමට කටයුතු කරනු ලැබේ. | කොන්ත්‍රාත්තුවට අදාළ නිවැරදි රඳවුම් මුදල මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් විය යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| රසායනාගාර ආදායම්, බලපත්‍ර නිකුත් කිරීම්, අලුත් කිරීම්, අයදුම්පත් ගාස්තු, දඩ මුදල් ආදායම්. | 26,891,126 | 28,376,522 | 1,485,396 | විගණන නිරීක්ෂණ අනුව මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් වටිනාකම රු28,376,522. | ආදායම් රැස්කරන අංශ හා උප කාර්යාල වලින් ලබාගත් තොරතුරු, මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් |

| | | | | |
|---|---|---|---|---|
| | | | | වටිනාකම සමඟ සසඳා වෙනසට හේතු සොයා ගත යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| දේපල, පිරියත හා උපකරණ | 168,357,986 | එක් එක් වත්කම් අයිතම අත්පත් කර ගත් දිනය හඳුනාගත හැකි පරිදි සකස් කළ ස්ථාවර වත්කම් ලේඛනය හා වත්කම් සමීක්ෂණ වාර්තා | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. 2024 වර්ෂයේ සිට අයිතම වෙන වෙනම දැක්වීමට කටයුතු කරනු ලැබේ. | ස්ථාවර වත්කම් ලේඛනයේ වත්කම් අත්පත් කර ගත් දිනය සහිතව අයිතම වශයෙන් දක්වා ජංගම නොවන වත්කම් වටිනාකමෙහි නිරවද්‍යතාවය ද සනාථ කරගත හැකි ආකාරයට සකස් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට රු.104,809,962 ක් වූ ගෙවිය යුතු ශේෂය තුළ පැවති වර්ෂ 5 ඉක්ම වූ රු.12,636,097 ක්, වර්ෂ 3 ඉක්ම වූ රු.3,006,832 ක් හා වර්ෂ 2 ඉක්ම වූ රු.1,757,365 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු මුදල් පරීක්ෂා කර 2024වර්ෂයේ ගිණුම් වලින් ගැලපීමට කටයුතු කරනු ලැබේ. | ගෙවිය යුතු ශේෂයන් වල නිරවද්‍යතාවය සොයාබලා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2023 පෙබරවාරි 27 දිනැති අංක අමප/23/038 6/605/ 012-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | . අධිකාරියේ සාමාන්‍යාධිකාරී තනතුර බාහිර පදනමින් ද, අනෙකුත් අංශවල කළමනාකරණ තනතුරු 05 ක් සඳහා අභ්‍යන්තර පදනමින් ද පුරප්පාඩු පිරවීමටත්, එසේ නොහැකි වන්නේ නම් අමාත්‍ය මණ්ඩල සටහනක් මඟින් අපේක්ෂිත සංශෝධන සිදුකර | අධිකාරියේ පුරප්පාඩුව පවතින ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු සඳහා බඳවා ගැනීමට රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීමේ අමාත්‍ය මණ්ඩල නිළධාරී | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ගැනීමටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් දන්වා එවා තිබුණු නමුත් එලෙස කටයුතු නොකර නීති කළමනාකරු ඇතුළු කළමනාකරණ තනතුරු 04 ක් බාහිර පදනම මතත්, සාමාන්‍යාධිකාරී තනතුර වසර 2 1/2 ක කාලයක් වැඩ බැලීමේ පත්වීමක් දැරූ නිලධාරියා වෙත අභ්‍යන්තර පදනම මතත් 2024 අප්‍රේල් 03 දින සිට ස්ථිර පත්වීම් ලබාදී තිබුණි. | කමිටුව වෙත 2023.01.11 ඉල්ලීමක් සිදු කරන ලදී. ඒ අනුව අනුමැතිය ලබා දීම කමිටුව විසින් නිර්දේශ කර ඇති බව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ අතිරේක ලේකම් විසින් අප වෙත දැනුම් දී ඇත. | |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී/01/ 2021 දරන රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොත | | | |
| (i) | 3.6 ඡේදය | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපායමාර්ගික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම මත පදනම් වූ ඵලදායී කාර්යසාධන ඇගයීම් පද්ධතියක් අධිකාරිය වෙත හඳුන්වා දී නොතිබුණි. | 2024 වර්ෂය අවසාන වීමට පෙර ඵලදායී කාර්යසාධන ඇගයීම් පද්ධතියක් අධිකාරිය විසින් හඳුන්වා දෙනු ලැබේ. | ඵලදායී කාර්යසාධන ඇගයීම් පද්ධතියක් හඳුන්වා දීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 6.7 ඡේදය | සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති ස්ථාවර වත්කම් සහ ගබඩා භාණ්ඩ සත්‍යාපනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂය තුළ භාණ්ඩ සමීක්ෂණය කමිටුවක් පත්කර අමාත්‍යාංශයේ නියෝජිතයෙකු පත්කර ගැනීමට අමාත්‍යාංශ ලේකම්තුමා වෙත ලිපියක් යොමු කර ඇත. ඉන්පසුව මාසයක් ඇතුලත භාණ්ඩ සමීක්ෂණය සිදුකර අවසන් කරනු ලැබේ. | ස්ථාවර වත්කම් සහ ගබඩා භාණ්ඩ සත්‍යාපනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 10(1) හා (2) | 10(1) උපවගන්තිය පරිදි නියමයන් සිදු නොකිරීම නිසා 10(2) උප වගන්තිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම මත සමුද්‍ර දූෂණයක් වැළැක්වීමට, අඩු කිරීමට, පාලනය කිරීමට හෝ | නියම කරන ලද පියවර ගැනීමට බලය අධිකාරියට පවතින අතර අදාල පරිදි කටයුතු කරන අවස්ථාවලදී පියවර ගැනීමට ද නියම කර ඇත. | පනත අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | උපවගන්ති | නතර කිරීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් දඩ අයකර ගැනීමට තිබූ අවස්ථා අහිමි වී ගොස් තිබුණි. | | |
| (ඇ) | 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 17 (7) වගන්තිය | සමුද්‍ර දූෂණ වැළැක්වීම සහ කළමනාකරණය කිරීම සම්බන්ධව අධිකාරිය අවශය යයි සලකනු ලබන විශේෂඥ දැනුම ඇති බාහිර පාර්ශවයකගේ දැනුම ලබා ගත හැකි වුවද, එසේ විශේෂඥ සහය ලබාගෙන නොතිබීමෙන් අන්තර්ජාතික වශයෙන් පවතින නිර්ණායක පරිදි මෙම කාර්ය දීර්ඝ කාලීනව කිරීමේ ඇති පාරිසරික වැදගත්කම, වෙරළ තීරයේ ස්ථායීතාවයට වන බලපෑම හා තවදුරටත් මෙම කාර්ය කොපමණ කාලයක් කළ යුතුද යන්න පිළිබදව තීරණයක් ගැනීමෙන් තොරව, රක්ෂණ සමාගමේ අභිමතය ද ලබා නොගෙන වෙරළේ ප්ලාස්ටික් පබලු ඇහිදීම අඛණ්ඩව සිදුකරගෙන යමින් තිබුණි. තවද, 2021 ඔක්තෝබර් සිට 2023 දෙසැම්බර් 31 දක්වා ප්‍රජා දායකත්වයෙන් දිස්ත්‍රික්ක 4 ක වෙරළ කලාප වල ප්ලාස්ටික් පබලු එකතු කිරීම සිදු කරන 158 දෙනෙකු සඳහා රු.20,116,500 ක දීමනා ගෙවා තිබුණි. | අන්තර් ජාතික ආයතන දෙකක සහය ඇතිව වෙරළ පිරිසිදු කිරීම ආරම්භ කර පසුව පවතින තත්වය හමුවේ තවදුරටත් විශේෂඥ සහය අවශ්‍ය නොමැති බැවින් ඔවුන් එම කටයුතු වලින් ඉවත් වෙන ලදි. වෙරළට අපද්‍රව්‍ය එකතු වීම විවිධ පරිසර තත්ව අනුව වෙනස් වී වරින් වර සාගරයේ පතුලේ ඇති නෞකාවෙන් ඉවත් වූ අපද්‍රව්‍ය වෙරළ කලාපයට ගලා ඒම සිදුවේ. එලෙස සිදුවනතාක් කල් වෙරළ පිරිසිදු කිරීම සිදු කල යුතුය .ඒ සඳහා ගෙවීම් සිදු කිරීමද අදාල නෞකාවේ රක්ෂණ සමාගමෙන් සිදු කල යුතුය .වෙරළ අවශ්‍ය ආකාරයට පිරිසිදු වූ පසු දෙපාර්ශවය අතර සාකච්ජා මඟින් වෙරළ පිරිසිදු කිරීම නැවැත්වීම සිදු කරනු ඇත. | අධිකාරිය අවශය යයි සලකනු ලබන විශේෂඥ දැනුම ඇති බාහිර පාර්ශවයකගේ දැනුම ලබා ගෙන මෙම කාර්ය දීර්ඝ කාලීනව කිරීමේ ඇති පරිසරික වැදගත්කම, වෙරළ තීරයේ ස්ථායීතාවයට වන බලපෑම හා තවදුරටත් මෙම කාර්ය කොපමණ කාලයක් කළ යුතුද යන්න පිළිබදව තීරණයක් ගැනීමටත් වර්ෂ 2 කට වැඩි කාලයක් අඛණ්ඩව සේවයේ යොදා ගෙන තිබුණු ප්‍රජාවෙන් සේවා ලබාගැනීමේදී එම ප්‍රජාවගේ සේවා අවශ්‍යතාවය කාර්ය සාධනය පදනමින් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 87,501,471 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 209,250,750 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 121,749,279 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආදායම රු.216,812,805 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | MV - X Press pearl නෞකා අනතුරින් සමුද්‍ර පරිසර පද්ධතියට ඇතිවූ බලපෑම හේතුවෙන් මියගිය කැස්බෑවන් හා සමුද්‍ර ක්ෂීරපායින්ගේ සිරුරු ඉදිරි විමර්ෂණ කටයුතු සඳහා NARA භූමියේ තබා ඇති අධිශීතකරණ කන්ටේනරයේ 2021 අගෝස්තු සිට 2023 මාර්තු දක්වා ගබඩා කිරීම සඳහා වූ කුලිය හා විදුලිබිල වෙනුවෙන් රු.1,966,007 ක් වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ගෙවා ඇති අතර එම මුදල නැවත එම ආයතනයට ගෙවා රක්ෂණ ආයතනයෙන් ප්‍රතිපූර්ණය කර ගත යුතු බවට 2023 ජුනි 07 දිනැති අංක 52/2023 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබාදී තිබුණ ද විගණිත දින වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මෙම ගෙවීම් පිළිබඳ තොරතුරු රක්ෂණ සමාගම වෙත යොමු කලද එය පරිසර හානි තක්සේරු කරන වාර්තාවට එකතු කර අදාල පරිදි ගෙවීම් පියවා ගැනීම සඳහා කටයුතු කරන ලෙස දන්වා ඇත. මෙම කටයුතු සඳහා වියදම් කිරීමට මෙම අධිකාරියට ප්‍රතිපාදන නොමැති බැවින් රේඛීය අමාත්‍යාංශයේ ලේකම් මගින්ද මෙම ගෙවීම් සිදු කරන ලෙස දන්වා ඇත. අවශ්‍ය මුදල් ලබා දෙන ලෙස මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර ඇත. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) | අධිකාරිය විසින් 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා මුද්‍රණය කරන ලද පිරිවැය රු.586,713 ක් වූ සිංහල හා දෙමළ සඟරා 3,110 ක් හා පිරිවැය රු.123,096 ක් වූ සමුදුර පුවත් පත් 15,387 ක් බෙදා නොහැර ගබඩාවේ රඳවා තිබුණි. | දැනට ඉතිරිව ඇති පිටපත් ඉදිරි වැඩසටහන් සඳහා යොදා ගන්නා අතර නැවත මුද්‍රණය කිරීමක් සිදු කරනු නොලැබේ. | අවශ්‍යතාවය හඳුනාගෙන මුද්‍රණය කිරීමටත්, බෙදාහැරීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) | MV-X Press Pearl නෞකා අනතුර සම්බන්ධයෙන් වූ හානිය තක්සේරු කිරීම සඳහා පත් කල විද්වත් කමිටුවට ගෙවිය යුතු දීමනා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 2023 ජනවාරි 30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව 5 දෙනෙකුගෙන් සමන්විතව පත්කළ කමිටුව මඟින් දිනකට පැය 8 ක් සඳහා ඇ.ඩො.350 ක් බැගින් ඇමරිකානු ඩොලර් 584,500 ක් විද්වත් කමිටුවට ගෙවීමට, එම කමිටුවට නම්කර තිබුණු ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිලධාරියාගේ නිර්දේශය ලබා නොගෙන තීරණය කර තිබුණි. එසේම විද්වත් කමිටුවේ සාමාජිකයින් රාජකාරියේ යෙදුණු කාලය මැනීමටත්, නිර්දේශ කළ එම රේටය ජාත්‍යන්තර රේටයක් ලෙස සනාථ කිරීම සඳහාත් කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවුණු අතර 2023 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ | ජාතික වැටුප් කොමිසමේ නියෝජිතයා මෙම කමිටුවට සහභාගී නොවන බවට ලේකම්තුමා වෙත දන්වා ඇති අතර ඉතිරි සාමාජිකයින්ගෙන් කමිටුවේ කටයුතු කරගෙන යාමට කමිටුව තීරණය කර කමිටුව වාර්තාව ඉදිරිපත් කර ඇත. ජාත්‍යන්තර ආයතන විසින් මෙවැනි කටයුත්තක් සඳහා ගෙවන ගාස්තු ප්‍රමාණයන් සලකා බලා පැය 8 ක දිනක් සඳහා ඇ.ඩොලර් 350 ක මුදලක් බැගින් ගෙවීමට පරිසර හානි ඇගයුම් වාර්තාවට ඇතුළත් කොට ඇත. අමාත්‍ය මණ්ඩලය මඟින් පත් කරන ලද ගාස්තු ප්‍රමාණය තීරණය කිරීමේ කමිටුවේ තීරණ වූයේ පැය 08ක දිනයක් සඳහා රු. 30,000 මුදලක් ගෙවිය යුතු බවත්. එක් එක් | විද්වත් කමිටුවේ සාමාජිකයින් රාජකාරියේ යෙදුණු කාලය මැනීමටත්, නිර්දේශ කළ රේටය ජාත්‍යන්තර රේටයක් ලෙස සනාථ කිරීම සඳහාත් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විද්වත් කමිටුවට ගෙවා තිබුණු රු.6,475,000 ක දීමනාව ගණනය කළ ආකාරය පිළිබඳව ද විගණනය වෙත සනාථ නොකරන ලදී. | විද්වත් කමිටු සමාජිකයාට ගෙවිය යුතු මුදලින් 25% ක් පමණක් ගෙවා ඉතිරිය වන්දි මුදල් ලැබුණු පසු ගෙවීමටත් ය. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත දැනට මූලික ගෙවීමක් පමණක් සිදු කර ඇත. සම්පූර්ණ ගෙවීම් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති අතර ගාස්තු ප්‍රමාණය තීරණය කිරීමට පත් කරන ලද කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. | |
| (ඈ) | ප්‍රජා සහාභාගීත්වයෙන් MV - X Press Pearl නෞකාවෙන් විසිරුණු පබලු ඇහිදීම සඳහා 2021 ඔක්තෝබර් සිට 2023 දෙසැම්බර් දක්වා දීමනා ලෙස රු.248,192,250 ක් හා උපකරණ, ප්‍රවාහන, ආහාර හා වෙනත් වියදම් සඳහා රු.553,824,237ක් වශයෙන් වියදම් දරා තිබුණි. දෛනිකව එකතු කරන ලබන මුළු පබළු ප්‍රමාණයෙහි සාමාන්‍ය අගය 2022 ට සාපේක්ෂව කි.ග්‍රෑම් 44 සිට 2023 වනවිට කිලෝ ග්‍රෑම් 20 කට ආසන්න අගයක් දක්වා අඩුවී තිබුණු නමුත් 2023 වර්ෂයේ ප්‍රජා සහභාගීත්වය සඳහා දරන ලද පිරිවැයෙහි අඩුවීම රු.මිලියන 124 ක සිට රු.මිලියන 106 ක් දක්වා රු.මිලියන 18 ක් පමණක් විය. | ප්ලාස්ටික් පබලු සුලු වශයෙන් පවතිය ද වෙරළෙහි වැඩි දුර ප්‍රමාණයක විසිරි ඇති බැවින් සැලකිය යුතු වෙරළ පවිත්‍ර කරන්නන් ප්‍රමාණයක් යෙදවිය යුතු වේ. ඒ අනුව තවදුරටත් 140 ක පමණ වෙරළ පිරිසිදු කරන්නන් ප්‍රමාණක් අවශ්‍යව ඇත. සැලකිය යුතු ශ්‍රමිකයන් ප්‍රමාණයක් අඩු කිරිමේ හැකියාවක් නොපවතින බැවින් ප්‍රජා සහාභාගිත්වය සඳහා යන වියදම් වල කැපිපෙනෙන අඩු විමක් නිරික්ෂණය නොවේ. 2021 ට සාපේෂව භාණ්ඩ හා සේවා වල මිල ඉහල යාම නිසා 2022 වසරේදී වෙරළ පිරිසිදු කරන්නන් සංඛ්‍යාව අඩු වුවද එම ප්‍රමාණයට සරිලන පරිදි වියදම අඩුවී නොමැත. | ප්‍රජාවගෙන් සේවා ලබාගැනීමේදී එම ප්‍රජාවගේ සේවා අවශ්‍යතාවය කාර්ය සාධනය පදනමින් විධිමත් ක්‍රමවේදයකින් අධීක්ෂණය කර සේවයේ යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2020 වර්ෂයේ රු.750,000 කට කොළඹ විශ්ව විද්‍යාලය වෙත පැවරු අධිකාරියේ වෙබ් අඩවිය සංවර්ධය කිරීමේ ව්‍යාපෘතිය 2020 ජුලි 30 දිනට ප්‍රථම අවසන් විය යුතු නමුත් වර්ෂ 3 කට අධික කාලයක් ගතවී එහි ප්‍රගතිය සමාලෝචනය කර කාර්ය ඉටුකරගෙන ව්‍යාපෘතිය අවසන් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අධිකාරියේ වෙබ් අඩවිය සැකසීම සඳහා එකඟවූ පරිදි 2020 වර්ෂයේ සිදු කර ගැනීමට නොහැකි විය. කෙසේ වුවද මේ වන විට වෙබ් අඩවිය සංවර්ධනය අවසාන අදියරයේ පවතී. | ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| MV X-Press Pearl නෞකා අනතුරට අදාළව ශ්‍රී ලංකාව විසින් (අධිකාරිය සහ අනෙකුත් ආයතන ද ඇතුළුව) දරන ලද වියදම් වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දක්වා වන කාලයට අදාලව අවස්ථා 17 ක දී ප්‍රතිපූර්ණය සඳහා නෞකාවේ රක්ෂණ සමාගමට යොමුකර තිබූ ඇ.ඩො මිලියන 50.4 කින් ඇ.ඩො මිලියන 14.6 ක් හා රු.මිලියන 931.8 ක් මහා භාණ්ඩාගාරයට ලැබී තිබුණු අතර වියදම් තොරතුරු ප්‍රමාණවත් නොවීම හා ඇස්තමේන්තුගත අගයන් වීම හේතුවෙන් ඇ.ඩො මිලියන 32.3 ක් ගෙවීම් ප්‍රතිපූර්ණය ප්‍රතික්ෂේප කර තිබුණි. රක්ෂණ ආයතනය වෙතින් ඇමරිකානු ඩොලර්වලින් වියදම් ප්‍රතිපූරණ ඉල්ලුම් කර තිබූ නමුත් රක්ෂණ ආයතනයෙන් මිලියන 931.8 ක් රුපියල් වලින් භාණ්ඩාගාරය වෙත ප්‍රතිපූරණ කර තිබීම ද ගැටළු සහගත විය. | අධිකාරිය මඟින් වෙරළ පිරිසිදු කිරීමේ කටයුතු ධීවර ප්‍රජාව යොදා ගෙන සිදු කරනු ලබන අතර ඒ සඳහා වැය වන පිරිවැය මේ වන විට එකඟතාව පවතින මිල ගණන් අනුව රක්ෂණ සමාගම මඟින් සිදු කරනු ලබයි. අධිකාරිය මඟින් මාසයක හෝ දෙකක කාලයකට වැය වන මුදලට අදාලව හිමි විය යුතු මුදල අන්තර්වාර හිමිකම් ලෙස රක්ෂණ සමාගම වෙත ඉදිරිපත් කිරීම සිදු කරනු ලබයි. | ප්‍රතික්ෂේප කිරීම් සලකා බලා ඉදිරියේ දී ප්‍රතිපූර්ණය සඳහා ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ දී නිසි සැලකිල්ලකින් කටයුතු කිරීමටත් සියලු ප්‍රතිපූර්ණයන් ලබාගැනීමටත් අවශ්‍ය කටයුතු කළ යුතුය. තවද රක්ෂණ ආයතනය වෙතින් ඇමරිකානු ඩොලර්වලින් වියදම් ප්‍රතිපූරණ ඉල්ලුම් කර තිබූ නමුත් රුපියල් වලින් ප්‍රතිපූරණ කර තිබීම සම්බන්ධව ද භාණ්ඩාගාරයෙන් විමසා එය නිරවුල් කර ගැනීමට ද කටයුතු කළ යුතුය. |

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියේ බැංකු ජංගම ගිණුම් වල සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ පැවති මුදල් ශේෂය රු. මිලියන 290 ක් ද, වර්ෂය අවසානයේ පැවති මුදල් ශේෂය රු. මිලියන 364 ක් ද විය. අධිකාරියේ සාමාන්‍ය මාසික ගෙවීම් අවශ්‍යතාවය සලකා අතිරික්ත මුදල වඩා වාසිදායක ආකාරයට ආයෝජනය කිරීමට කටයුතු නොකර ඉතා කෙටි කාලීන ආයෝජනයන්හි යෙදවීමෙන් ලබාගත හැකිව තිබූ පොලී ආදායම් අහිමි වී තිබුණි. | මෙම මුදල් වලින් දැනට රු.මිලියන 100ක් අධිකාරියේ අරමුදල් ගිණුමටද, රු. මිලියන 37.1ක් සේවක පාරිතෝෂිත ගිණුමටද බැර කර භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර ඇත. ඊට අමතරව මාසික ගෙවීම් ද්‍රවශීලනය සලකා අනෙකුත් මුදල් මාසයක කාලයක් සඳහා තිබූ දෛනික පදනම මත ද ආයෝජනය කර ඇත. | අධිකාරියේ සාමාන්‍ය මාසික ගෙවීම් අවශ්‍යතාවය සලකා අතිරික්ත මුදල වඩා වාසිදායක ආකාරයට ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2011 වර්ෂයේදී අනතුරට පත්වූ නැවකින් ලැබුණු රු.මිලියන 10 ක වන්දියක් හා 2022 වර්ෂයේදී රඳවාගත් ඉපැයීම් වලින් රු.මිලියන 100 ක් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අරමුදල නමින් ගිණුමකට බැර කර එම මුදල භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරමින් තිබුණු අතර ආයෝජන පොලී එකතුවීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට එම අරමුදලේ ශේෂය රු.119,486,831 ක් වී තිබුණි. එසේ වුවද, සමුද්‍රීය පරිසර දූෂණය වැළැක්වීම සම්බන්ධ කළයුතු කාර්යයන් හඳුනා නොගෙන මෙම අරමුදල නිෂ්කාර්යව පැවතුණි. | අධිකාරියේ ගාස්තු, දඩමුදල් අයකිරීම්, දණ්ඩන වශයෙන් ලැබෙන සියළු මුදල් සහ ශ්‍රී ලංකාව තුල හෝ ඉන් පිටත කවර හෝ ප්‍රභවයකින් ලැබෙන, පරිත්‍යාග හෝ ප්‍රදාන බැරකිරීම සඳහා අධිකාරිය අරමුදලක් පවත්වාගෙන යා යුතුය.<br>ඒ අනුව අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ඇතිව 2011 වර්ෂයේදී රු.මිලියන 10 කින් මෙම අරමුදල ආරම්භ කර 2022 වර්ෂයේ රඳවාගත් ඉපැයීම් වලින් රු.මිලියන 100 ක් අරමුදලට බැර කරන ලදී. එම මුදල් දැනට භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කර ඇත. යම් සමුද්‍රීය පරිසර දූෂණයක් සිදු වුවහොත් මෙම අරමුදල් භාවිතා කරනු ලැබේ. | 2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 18 (2) වන වගන්තිය අනුව අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමේදී, කර්තව්‍ය ඉටු කිරීමේ දී හා කාර්යකිරීමේ දී අධිකාරිය විසින් කරනු ලබන යම් වියදමක් දැරීම සඳහා අවශ්‍ය වන සියලු මුදල් ප්‍රමාණයන් මෙම අරමුදලින් ගෙවනු ලැබිය යුතුය. |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2011 වර්ෂයේ මිලදී ගන්නා ලද රු.672,000 ක වටිනාකමකින් යුතු ඩිංගි බෝට්ටුවක් හා 2021 වර්ෂයේ මිලදී ගන්නා ලද රු.255,000 ක අධිශීතකරණයක් භාවිතයට ගැනීමකින් තොරව අනාරක්ෂිතව ආයතනයේ රඳවා තිබුණි. | ඩිංගිබෝට්ටු මේ වන විට භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පවතින අතර එය අපහරනය කිරීමට(එංජිම හැර) කටයුතු කර ඇත. මෙහි එංජිම නැගෙනහිර පළාතේ ක්ෂේත්‍ර රාජකාරී කටයුතු සඳහා ලබා දී ඇත.<br>අධිශිතකරණය MV X – Press Pearl නෞකා ව්‍යසනය ආශ්‍රිත ජල සාම්පල ගබඩා කිරීමේ අරමුණින් ප්‍රධාන කාර්යාලයේ තබා ඇති අතර තවදුරටත් ජල සාම්පල ගබඩා කිරීමේ අවශ්‍යතාවයක් මතු නොවුන හොත් එය ගාල්ල පිහිටි රසායනාගාරයට යැවීමට කටයුතු කරනු ලැබේ. | මෙම වාර්තාවේ දින වන විටත් අපහරණය කර නොතිබූ අතර උපකරණවල අවශ්‍යතාවය හා භාවිත හැකියාව පිළිබඳ පරීක්ෂා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමටත් එතෙක් ආරක්ෂිතව තැබීමටත් කටයුතු කළ යුතුය. |

**3.5 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | MV - X Press Pearl නෞකා අනතුර සම්බන්ධයෙන් වූ හානිය තක්සේරු කිරීමේ කාර්ය සඳහා පත්කරන ලද විද්වත් කමිටු සාමාජිකයින් 45 දෙනෙකුට 2021 ජුනි 12 දිනැතිව අධිකාරිය විසින් පත්වීම් ලිපි ලබා දී | MV X press pearl අනතුර සිදු වීමෙන් පසුව නීති උපදෙස් වලට අනුකූලව අධිකාරිය විසින් අවශ්‍ය පරිදි විද්වත් කමිටුවක් පත් කරන ලදි. නීතිපතිවරයා විසින් සිවිල් | උපදේශන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබූ නමුත් එම කමිටුවේ ඇතුළත් විද්වතුන් තෝරා ගැනීමේදී උපදේශන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 හා 3.7.1 පරිදි තෝරාගැනීමේ ක්‍රමවේදයන් අනුගමනය කර නොතිබුණි. | නඩුකරය සිංගප්පූරුවේ පැවරීමෙන් පසු නීතිපති දෙපාර්තමේන්තුව විදේශීය විශේෂඥ සහය ලබා ගැනීමට කටයුතු කළ බැවින් තවදුරටත් විද්වත් කමිටුවේ කටයුතු ඉදිරියට සිදු නොකරන ලදි. | |
| (ආ) | ගාල්ල විද්‍යාගාරය සඳහා 2023 ජූලි 31 දින ඇනවුම් කර තිබුණු රු. 1,888,000 ක් වටිනා Analytical Balance උපකරණයක් 2024 මාර්තු 11 දින භාර දී තිබුණු අතර එම උපකරණය පිරිවිතරවලට අනුකූල නොවීමෙන් සැපයුම්කරු වෙත නැවත භාර දී තිබූ නමුත් මෙම වාර්තාවේ දිනය දක්වාම නැවත සැපයීම් කර නොතිබුණි. | මෙම උපකරණය තත්ත්ව පරීක්ෂාවේ දී නිසි පරිදි ක්‍රියාත්මක නොවූ බව තහවුරුවුයෙන් දෝෂය නිවැරදි කිරීමට සැපයුම්කරුට යොමු කරන ලදි. නමුත් මේ වන තෙක් එහි දෝෂය නිවරදි කිරිමට මෙම ආයතනය කටයුතුකර නොතිබීම නිසා එම ඇණවුම අවලංගු කිරීමට කටයුතු කරන ලදි. මේ වන තෙක් එම ආයතනය වෙත කිසිදු මුදලක් ගෙවා නොමැති අතර ඉදිරි ප්‍රසම්පාදනයන්හි දී විගනණය විසින් පෙන්වා දෙන පරිදි 8.9.1ආ සහ 8.9.3ප්‍රකාරව ලිඛිත ගිවිසුම් වලට එළඹීමට කටයුතු කරන බව ද කාරුණිකව දන්වමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 වාර්ෂික වාර්තාව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2024 අගෝස්තු 31 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය ප්‍රකාරව වාර්ෂික වාර්තා ගිණුම් වර්ෂය අවසන් වී මාස 05 ක කාලයක් ඇතුලත පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ ගාල්ලේ පිහිටි රසායනාගාරය සඳහා ISO IEC 17025: 217 තත්ත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරීමට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙන් වෘත්තීය සහාය ලබා ගැනීම සඳහා 2023 ක්‍රියාකාරී සැලැස්මෙන් රු.760,000ක් වෙන් කර තිබුණ ද, එම කාර්යය අවසන් කර නොතිබීමෙන් ISO තත්ව පාලන සහතිකය ලබාගැනීමට නොහැකි වී තිබුණි. | මෙයට මූලික බාධාවක් වී ඇත්තේ ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් නොමැති වීම හා රසායනගාරයට අනුයුක්තව කරන ලද කාර්යය මණ්ඩලය වරින් වර ඉවත්ව යාමයි . ඒ නිසා ISO තත්ව කළමනාකරණ සහතිකය ලබා ගැනීම ප්‍රමාද වී ඇත. | ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යය අවසන් කර ගැනීමට කටයුතු කළ යුතුය. |